# විශ්‍රාන්තියේ යථාර්ථයඃ රුසියානු අත්දැකීම්

ජේ.එම්.සී.කේ. සෙනෙවිරත්න

කලාව මුළු මහත් සමාජයක් අධ්‍යාත්මිකව හා මිනිසත් බව සහිතව අරුත් ගැන්විය හැකි පුදුමාකාර වූ බලවේගයකි. අනුවාදය තුළ මෙසේ සඳහන් වේ. '' ස්වභාවික සෞන්දර්ය ජීවිතයේ ප්‍රකෘතිය හා එක්තැන් කොට දක්වීමෙහි ලා චේකොව් තුළ වූ හැකියාව විශ්මය ජනකය'' ජීවිත අභ්‍යන්තර තුළ ගැබ්ව පවතින්නා වූ ස්වභාවිකත්වය වඩාත් කලාත්මකව පාඨක මනසට හා හදවතට දනෙන්නට චෙකොව් තම නිර්මාණකරණයෙහි නිරත විය '' පළගැටියා'' ඇන්තෝනි චේකොව් විසින් ලියන ලද උසස්තම කතා කිහිපයෙන් එකක් ලෙස හැඳින්විය හැක. ඇන්තොන් චේකොව් විසින් රචිත ''පළගැටියා'' කෘතිය අහංගම පියසිංහ විසින් සිංහලයට පරිවර්තනය කරන ලදි. පොදු ජන ජීවිතයක විවිධත්වය තුළ පවත්නා විශ්‍රාන්තිය එමඟින් මනාව පිළිඹිබු කරයි.

නිදහස් කාල සීමාව තුළ සතුටු සාමිච්චියේ යෙදීම කාන්තාවන්ට පොදු වූ ලක්ෂණයකි. ඇය සියළු වැඩ අවසන් කර ඒ අපූරු අවස්ථාව එනතුරු මඟබලා සිටියි. '' ඔල්ගා ඉවනොව්නා'' තම සියලු දෛනික වැඩ අවසන් කර සන්ධ්‍යා භාගයේ ඒ සඳහා සූදානම් වේ. '' තම හිතවතුන් පිළිගැනීම් වස් ඇය නිවැසෙහිම නතර වී සිටියා ය. එහි කාඩ් සෙල්ලම් කිරීම හා ආලිංගන නැටුම් දක්නා ලදි.'' මේ අපූරු කාලය එකතු වන පිරිස තුළින් විවිධාකාර වූ කලාත්මක අංගයන් ඉදිරි පත් වේ. '' ප්‍රසිද්ධ නළුවා තම නාට්‍යයක අංශයක් ගෙන හැර දක්වයි. ගීතඥයා ගී ගයයි. චිත්‍ර ශිල්පියා ඔල්ගා ඉවනොව්නාගේ සිහිවටන පොතෙහි තෙල් සායම් චිත්‍රයක් අඳියි. වාදකයා කිසියම් වාදනයක යෙදෙයි'' ගායනය, චිත්‍ර ඇඳීම, වාදනය වැනි කලා අංගයන් තුළින් ඔවුන්ගේ මානසික වින්දනය සඵල කර ගනියි. වසන්ත සමය බොහෝ දෙනෙකුට විනෝදාස්වාදය උරුම කර දෙයි. වසන්ත සෘතුව එනතුරු නොඉවසිල්ලෙන් බලා සිටියි. වසන්තය විශ්‍රාන්තිය කැටි කොටගත් සාගරයක් වැනිය. මොස්කව් වැසියන් වසන්ත සමයේ විනෝදය තම ජීවිතය තුළට විවිධ අයුරින් සමීප කර ගනියි. ''කෝකිල ගීයෙන්, විනෝදචාරිකාවෙන්, බිලී බෑමෙන් හා සිතුවම් ඇඳීමෙන් විසිතුරුව, අප්‍රේල් මැයි ජුනි තෙමස මොස්කව් නගරයෙන් බොහෝ ඈත  පිටිසර බද කුටියේ ගෙවී යනු ඇත.'' ඔල්ගා ඉවගොව්නා විනෝදයට දැඩි කැමැත්තක් දක්වන කාන්තාවකි. '' වොල්ගා නදී බඩ පැවැත්වෙන කලාකරුවන්ගේ විනෝද සංචාරයට, එම කණ්ඩායමේ නිත්‍ය සාමාජිකාවක් වශයෙන් ඔල්ගා ද සහභාගී විය. සංචාරය කිරීම විනෝදයේ ප්‍රමුඛතම අංගයකි. සංචාරයකට අවශ්‍ය සියල්ල සූදානම් කර ගනිමින් ගමනේ යෙදෙන්නට බොහෝ දෙනෙක් රුචිකත්වය දක්වති'' ඇය දනටමත් සංචාරක ඇඳුම් කට්ටල දෙකක් හා සායම් වර්ග ද පින්සල්, කැන්වස් ආදිය ද අලුත් වර්ණ පළකයක් ද සූදානම් කරගෙන තිබේ'' යම් කෙනෙක් තම මානසික වින්දනය උදෙසා චිත්‍ර ඇඳීමෙහි නිතර වේ. සොබා දහමේ සුන්දරත්වය සංචාරය තුළින් සොයාගොස් එහි අපූරු තැන් චිත්‍රණය කිරිමෙන් අපූරු වින්දනයක් ලබයි. හැරගිය තම ස්වාමියා හෝ බිරිඳ පිළිබඳව සිහි කරමින් සිටිනා විට බොහෝ දෙනෙකුගේ සිත් තුලට වේදනාවේ කඳුළු කැට ගලා ආව ද යම් අවස්ථාවල ඔවුනොවුන් හා ගත කළ සොඳුරු අවස්ථා ද සිහියට නැගේ. ''කායික  පාරිශුද්ධතාවයේත් සාමකාමීත්වයේ ප්‍රීතිය භුක්ති විඳිමින් සංසන්දනාත්මකව  තම සැමියා අසලට වී හිඳගෙන සිටින සැටියක් ද, යළිත් නිවී සැනසිල්ලේ නෘත්‍යශාලාවෙහි අසුන්ගෙන ගීතයකට කන්දෙන සැටියන් ද ඇයට දනෙන්නට විය''. වින්දනය ලබන්නට සීමා නොමැත. එය මේ යැයි කොටුකර දක්විය නොහැක. කලාකරුවා තමා නිර්මාණය දෙස බලා සිටිමින් තනිවම එහි සුන්දර බව විඳිමින් නිහඬවම ඒ තුළ ජීවත් වේ. ''හැම අවස්ථාවකම පාහේ රිය බොවුස්කි තම චිත්‍රය පිළිබඳ ප්‍රසන්නතාවයකින් ප්‍රබෝධමත්ව බලා සිටිනු ඇයට දක්නට ලැබෙයි''. විනෝදය කෙනෙකුට ආවේණිකය. ආවේණිකත්වයෙන් මිදිය නොහැකි ඔවුන් තමන්ගේ හැකියාව තුළින් විනෝදය ලබති. '' අද  එක චිත්‍රයක්, ගිය අවුරුද්දේ එකක් , ආයෙත් ලබන මාසයේ විතර තවත් එකක් ඔබට මෙය එපා වෙන්නේ නැද්ද? මං කරන්නේ චිත්‍ර කර්මය අතහැර දා සංගීතය හෝ වෙනත් එබඳු ගැඹුරු කලාවක් ඔස්සේ යාමයි. ඔබ චිත්‍රකාරියක් නොවේ. ඔබ සංගීතකාරියක්.''

චෙකොව්  තම කෘතිය තුළින් මිනිස් ජීවිතය තුළ ජීවත් වෙමින් ඔවුන්ගේ සැබෑ වින්දනයන් අපූරුවට ගළපා ඇත. මුළු මහත් සමාජයටම ශ්‍රේෂ්ඨ ගණයේ කෘති දායාද කර ඇන්තොන් චෙකොව්ගේ ''පළගැටියා'' නමැති කෘතිය විශ්‍රාන්තිය වඩා ස්වභාවිකව වර්ණ ගන්වා ඇත. පළගැටි ජීවිතයක් තුළින් ද සංතෘෂ්ටියේ නිමේෂයන් සොයා ගත හැක.

අහංගම ජයසිංහ, පළගැටියා, (1959), කුරුලු ප්‍රකාශන සමාගම.